**වැඩිවන දරිද්‍රතාවය මැනබැලීමේ ව්‍යාපෘතිය - 2016 මාර්තු 24 සිට 2017 මාර්තු 31**

---

වැඩිවන දරිද්‍රතාවය මැනබැලීමේ ව්‍යාපෘතියේ 2016 මාර්තු 24 සිට 2017 මාර්තු 31 දක්වා වූ පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 මාර්තු 24 දින එළඹි ප්‍රදාන අංක ටීඑෆ් 018397 දරන සංඛ්‍යාලේඛන ධාරිතා වර්ධන භාර අරමුදලේ 2.05(ඇ) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ප්‍රදාන ගිවිසුම අනුව, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, වැඩිවන දරිද්‍රතාවය මැනීමට තාක්ෂණ නියමු භාවිතයන් සිදුකිරීම මගින් දත්ත රැස්කිරීම වැඩිදියුණු කිරීම, ශ්‍රම බලකාය වැඩි කිරීම, ශ්‍රම බලකා සමීක්ෂණ හා ගෘහස්ථ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයන්හි නියැදීම් හා ප්‍රශ්නාවලි සැලසුම් වැඩිදියුණු කිරීම සහ නේවාසික අංශවල නිර්වචන යාවත්කාලීන කිරීමයි. ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 23.91 කට සමාන එජඩො 160,000 ක් වූ අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 මාර්තු 24 දින ආරම්භ කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට නියමිත විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කටයුතු 2017 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරුවනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 මාර්තු 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව

(ඉ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම්, ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

--------------

**2.1 මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2017 මාර්තු 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 මාර්තු 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය , සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, හා 2017 මාර්තු 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | කාල පරිච්ඡේදය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | 2017 මාර්තු 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| ජා.සං.ස | 0.16 | 23.91 | 23.56 | 0.15 | 22.58 |
| එකතුව | 0.16 | 23.91 | 23.56 | 0.15 | 22.58 |

ඉහත තොරතුරුවලට අනුව, රු.මිලියන 23.91 කට සමාන එජඩො 160,000 ක්වූ වෙන්කිරීමෙන් රු.මිලියන 22.58 කට සමාන එජඩො 151,217 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, උපයෝජනය නොකල ප්‍රදාන රු.මිලියන 1.33 කට සමාන එජඩො 8,783 ක් 2017 මැයි 22 දින ප්‍රදාන නියෝජිතායතනය වෙත ආපසු යවා තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, පරිගණක සහායක පුද්ගල සම්මුඛ සාකච්ඡා, නියැදීම් සහ සැලසුම් යොදා ගැනීම මෙන්ම නේවාසික අංශ ආදියෙහි නිර්වචන යාවත්කාලීන කිරීම මගින් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නියමු දත්ත රැස්කිරීම ක්‍රියාත්මක කිරීමට තාක්ෂණික අවශ්‍යතාවයන්ට

ප්‍රවේශවීමට තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා උපදේශක සේවා ලබාගැනීම ආදියට කොන්ත්‍රාත්තු ලබාදී තිබුණි. ඉදිරිපත් කළ තොරතුරු අනුව, මූලික කාර්යයන් 2016 දෙසැම්බර් 27 දින වනවිට සැලසුම් කළ පරිදි ඉටු වී නොතිබීම හේතුවෙන් ව්‍යාපෘති කාලය 2017 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

ව්‍යාපෘතිය ආරම්භයේ සිට මාස 06 ක් ගතවීමෙන් පසු, පරිගණක සහායක පුද්ගලික සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිතා කිරීම මගින් දත්ත රැස්කිරීම සඳහා රු.මිලියන 4.65 ක පිරිවැයකට ටැබ් පරිගණක 90 ක් 2016 සැප්තැම්බර් මාසයේදී ප්‍රසම්පාදනය කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි. ටැබ් පරිගණක සඳහා ලංසු කැඳවීමේ ලේඛනවල සඳහන් කර තිබූ පිරිවිතර පසුව වෙනස් කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරන ලද පැහැදිලි කිරීම්වලට අනුව, දෙපාර්තමේන්තුවේ විශේෂ අවශ්‍යතා සලකා බලා එම වෙනස්කම් සිදුකර තිබූ අතර තෝරාගත් ලංසුකරු 2016 නොවැම්බර් 23 දින කොන්ත්‍රාත්තුව නිමකර තිබුණි.